"පුමිතිරි" - ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පිළිබඳ විද්‍යුත් සඟරාව
**Online ISSN: 3051-4924**
https://journals.sjp.ac.lk/index.php/pumithiri
**වෙළුම: 2; II කලාපය; 2025 නොවැම්බර්; පිටු: 23-34**

# ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බුදුදහමේ විචාරාත්මක චින්තනය පිළිබඳ අධ්‍යයනයක්

**ජී. ආර්. එම්. ඒ. ගම්ලත්[1] සහ පූජ්‍ය මැටිබැඹියේ ධම්මසිරි හිමි[2]**
[1]ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය;
[2]පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
manojagamlath@gmail.com

**සංක්ෂේපය**
ආගමික සාහිත්‍යයන්හි සඳහන් ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ අධ්‍යයනයන්, වර්තමාන සමාජය සඳහා එම සංකල්පවල විචාරාත්මක චින්තනයේ අදාළතාව අනාවරණය කර ගැනීම සිදු කරනු ලබන මෙම අධ්‍යයනය බහුකෝණීය සමාජ අත්දැකීම් අනුව ආගමික අදහස් පිළිබඳව විවෘත සංවාදයන්ට අවකාශය දීම ආදී පැතිකඩයන් ඔස්සේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ අදහස් ගොනු කිරීමත් එම සංකල්පයේ ආගමික ඉගැන්වීම්වල විචාරාත්මක චින්තනයේ වැදගත් බව අණාවරණය කරයි. තේමා පාදකව දත්ත ගොනු කිරීමත් සන්ධාර විශ්ලේෂණයට අනුව ප්‍රතිඵල හා සාකච්ඡාව සිදු කර ඇත. ඉගෙනුම් කුසලතා අතුරින් විචාරාත්මක චින්තනය (Critical thinking) පියවර අටකින් සමන්විත බව මයිකල් තෝමස්සේව්ස්කි පවසයි. බුද්ධ දේශනා සියල්ලම පාහේ ස්ත්‍රි පුරුෂ දෙපාර්ෂවයට ම සමානව අනුගමනය කිරීමට මගපාදා ඇත. ත්‍රිපිඨකාගත කරුණුවලට අනුව බුද්ධ ශාසනය තුළ තනතුරු ප්‍රදානය කිරීම හා ගිහි-පැවිදි සමාජ පිහිටුවීමේදී සමානව සංග්‍රහ කර ඇති බව අධ්‍යයනයෙන් අනාවරණය කර ගත හැකි විය. ගෘහස්ථ මෙන්ම සමාජමය කටයුතුවලදී ද ස්ත්‍රී පුරුෂ සමාජභාවය ආරක්ෂා කර ඇති බව සිගාලෝවාද සූත්‍රය, ධීතු සූත්‍රය, කුණ්ඩල කේසාථෙරි අපදානය හා ථෙරථේරී ගාථා තුළින් පැහැදිලි වේ. පියා පමණක් නොව මව ද දරුවන්ගේ පූර්ව ආචාර්යා බව අන්ගුත්තර නිකාය 111හි සඳහන් වේ. සතරාකාරයේ බ්‍රහ්ම ගුණවලින් යුත් තැනැත්තන් ලෙස පියා හා මව යන දෙදෙනාම බුදු දහමේ ඇගයීමට ලක් කර ඇත. මව්පියන්ට ගරු කරන්නා දියුණුවෙන් දියුණුවට පත්වන බව මංගල සූත්‍රයේ දැන්වෙන අතර ඔවුන්ට ගරහන්නා විනාශයට පත්වන බව පරාභව සූත්‍රයේ සඳහන්වේ. ත්‍රිපිඨකාගතයට අනුව බුදුදහමේ දේශනා තුළ විචාරශීලීව ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබද ධනාත්මක විවරණයන් සිදු කර ඇත. සමාජයේ විවිධ පැතිකඩයන්හිදි පුරුෂයාට මෙන්ම ස්ත්‍රියටද සම අයිතිවාසිකම්, ගරුකිරීම් හා පිළිගැනීම් ලබාදී ඇති බුදුසමය සමාජය දෙස විචාරශීලිව බලා ජීවිතයේ ඉගෙනුම් ඉගැන්වීම් මැනවින් හදුනාගෙන දෙලොවම යහපත් කර ගත හැකි මග පෙන්වා දී ඇත. ස්ත්‍රී පුරුෂ සමාජභාවය සමානව සුරුකීම සඳහා මානව අයිතීන් උල්ලන්ගනය නො කොට සිටලුමදෙනාට පොදුවේ ජීවිතය හා ධර්මය හිමි කර දී ඇති බව විචාරාත්මකව නිගමනය කළ හැකිය.

**මුඛ්‍ය පද:** ආගමික අර්ථකථනය, ත්‍රිපිටකය, විවේචනාත්මක චින්තනය, ස්ත්‍රී-පුරුෂ සමානත්වය, සමාජීය නීතිමය හා මානව හිමිකම්

## හැඳින්වීම

"පුද්ගලයන් ස්වකීය ලිංගිකත්වය හා සමාජය තුළ ඇති ස්ථානය තෝරා ගැනීමට බලපාන ආකල්ප, මූලධර්ම හා බලාපොරොත්තුවල එකතුවකි." යන්න Doing Gender (1987) ග්‍රන්ථයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය අර්ථකථනය කරයි. ඒ අනුව විවිධ ආගම්වල ස්ත්‍රී පුරුෂ භූමිකා සහ ඒවාට ඇති ඉගැන්වීම් හා අනුවර්තනයන්, ආගමික සාහිත්‍යයන්හි සඳහන් ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ අධ්‍යයනයන්, වර්තමාන සමාජය සඳහා එම සංකල්පවල විචාරාත්මක චින්තනයේ අදාළතාව අනාවරණය කර ගැනීම බහුකෝණීය සමාජ අත්දැකීම් අනුව ආගමික අදහස් පිළිබඳව විවෘත සංවාදයන්ට අවකාශය දීම ආදී පැතිකඩයන් ඔස්සේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ අදහස් ගොනු කිරීමත් එම සංකල්පයේ ආගමික ඉගැන්වීම්වල විචාරාත්මක චින්තනයේ වැදගත් බව අණාවරණය කර ගැනීමක් අපේක්ෂා කෙරේ.

අද්‍යතනයේ දී ශාස්ත්‍රීය අධ්‍යාපනයට වැඩි අවධානයක් ලබාදෙන අධ්‍යාපන ක්‍රමය තුළ ඉගෙනුම් ඉගැන්වීම් කාර්යේදී ශිෂ්‍යයන්ට අවශ්‍ය දැනුම, ආකල්ප, කුසලතා, යහපුරුදු, සතිමත් බව මෙන්ම සමාජ කුසලතා ශිෂ්‍යයන් තුළ සංවර්ධනය කිරීම

සඳහා විසිඑක් වැනි සියවසේ කුසලතා පුරුදු පුහුණු කළ යුතු බව බොහෝ අධ්‍යාපඥයින්, දාර්ශනිකයින් හා දෙස්විදෙස් විචාරකයින් අදහස් දක්වයි. සාමාන්‍ය පාසල් වපසරිය තුළ ඉගෙනුම් ඉගැන්වීම් කාර්යයේදී විසිඑක්වන සියවසේ කුසලතා (21st century skills) පිළිබඳ සංවාදය ගොනු වී ඇත. මෙම කුසලතාවන් සාකච්ඡා කරන ලෝක සංවිධාන, ආයතන හෝ දාර්ශනිකයින්, අධ්‍යාපනඥයින්, මනෝවිද්‍යාඥයන් ආදි සියලු ම දෙනා පෙන්වා දෙනු ලබන ප්‍රධානතම ඉගෙනුම් කුසලතා (Learning skills) හතරක් ඇත. ඒ අතර විචාරාත්මක චින්තනය (**C**ritical thinking) නිර්මාණාත්මක බව (**C**reativity) සහයෝගීතාව (**C**ollaboracion) හා සන්නිවේදන (21st Century Skills A Handbook, 2020).

ඉගෙනුම් කුසලතා අතුරින් විචාරාත්මක චින්තන කුසලතාවය වැදගත් ම කුසලතාවය ද වෙයි. එසේ ම අනෙකුත් සෑම කුසලතාවක් ම එකට සම්බන්ධ කරන අත්‍යාවශ්‍ය ම කුසලතාවය විචාරාත්මක චින්තන කුසලතාවය ද වෙයි. එසේ හෙයින් වර්තමාන සාමාන්‍ය පාසල් අධ්‍යාපනයේ දී අනාගත ලෝකයට හා අනාගත ලෝකයේ අභියෝග ජය ගත හැකි පුරවැසියෙකු බිහි කිරිම සඳහා ඉගෙනුම්ලාභියා තුළ ඉගෙනුම් කාර්යේදී විචාරාත්මක චින්තනය සංවර්ධනය වන අයුරින් ආගමික විෂය ඉගැන්විය යුතු වන්නේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය ඔප්නැන්වෙන අයුරිනි. විචාරාත්මක චින්තනය සංවර්ධනය කිරීම සඳහා බුද්ධ ධර්මය විෂය ඉගැන්වීමේදී උපයෝගී කර ගත හැක්කේ කෙසේ ද? එහි පුමතිරි සමාජභාවයේ වැදගත් කම කෙසේද යන්න අධ්‍යයනය කිරීම මෙමගින් අපේක්ෂිත ය.

## ක්‍රමවේදය

මෙම පර්යේෂණය ශාස්ත්‍රීය පර්යේෂණයකි. එබැවින් ශාස්ත්‍රීය පොතපත ආශ්‍රයෙන් අධ්‍යයනය සිදු කර ඇත. ලිඛිත මූලාශ්‍රය උපයෝගි කර ගෙන දත්ත රැස්කිරීමත් ඒවා තේමා ඔස්සේ විශ්ලේෂණය කිරීමට අවශ්‍ය හෙයින් සන්ධාර විශ්ලේෂණය යොදා ගන්නා ලදී. එහිදි පාලි පාඨ වැඩිදුරටත් අර්ථකථනය කිරීමට හා විශ්ලේෂණය සිදු කිරීම සඳහා පාඨ විශ්ලේෂණයත් යොදා ගනු ලැබීය. පළමු ව දත්ත එකතු කිරීමත් ඒවා විශ්ලේෂණය කිරීමත් එමගින් නිගමනවලට එළඹීම සිදු කර ඇත. ප්‍රාථමික මූලාශ්‍රය ලෙස පාලි ත්‍රිපිඨක ග්‍රන්ථ ද දෙවනුව ඒ හා තදනුබද්ධ වු ද්විතීක මූලාශ්‍ර ද භාවිත කෙරේ. විචාරාත්මක චින්තනය පිළිබඳ මෑතකාලයේ විවිධ ජාත්‍යන්තර සංවිධාන, ආයතන හා ලොව පිළිගත් අධ්‍යාපනඥයින්ගේ හා දාර්ශනිකයින්ගේ අදහස් කැටිකොට ගත් ග්‍රන්ථ හා වෙබ් පිටු යනාදිය මෙම පර්යේෂණය සඳහා භාවිත කරන ලදී.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

21 වැනි සියවසේ ප්‍රධානතම ඉගෙනුම් කුසලතා හතරක් දක්වා ඇත. ඒ අතර විචාරාත්මක චින්තනය, නිර්මාණශීලී බව, සහයෝගීතාව හා සන්නිවේදනය යන කුසලතා වෙයි (21st Century Skills A Handbook, 2020). සියලු කුසලතා සංවර්ධනය කර ගැනීම සඳහා අත්‍යාවශ්‍ය ම කුසලතාවක් ලෙස විචාරාත්මක චින්තනය වඩාත් ම වැදගත් වන අතර අනෙකුත් සියලුම කුසලතා අන්‍යෝන්‍ය සබඳතාවයෙන් යුතුව සංවර්ධනය කර ගැනීමට නම් විචාරාත්මක චින්තන කුසලතාව මනාව ප්‍රවර්ධනය කළ යුතු බව සකාරණාව දක්නට ලැබේ. එසේ හෙයින් විචාරාත්මක චින්තනය හා එය දරුවන් තුළ සංවර්ධනය කිරීමේදී ස්ත්‍රී පුරුෂ සමාජභාවය කොතෙක් දුරට වැදගත් වේද යන්න සොයා බලන ලදී.

අධ්‍යයනයේ මේ පිළිබඳ අදහස් හා නිර්වචන බොහෝ ප්‍රමාණයක් ඉදිරිපත් කර ඇත. ඒ අතර වැදගත් යැයි සම්මත අපරදිග හා පෙරදිග අධ්‍යාපඥයින්, දාර්ශනිකයින්, මෙන්ම ආගමික නායකයින් විසින් ඉදිරිපත් කර ඇති නිර්වචන සංකල්ප හා ඒ ආශ්‍රිත ඉගෙනුම් ඉගැන්වීම් ශිල්ප ක්‍රම යොදා ගනිමින් අධ්‍යයන කටයුතු සිදු කරන ලදී.

"කියවන, අසන, කියන හෝ ලියන දේ ගැන ප්‍රශ්න කරන, විශ්ලේෂණය කරන, අර්ථකථනය කරන, ඇගයීම් හා විනිශ්චයක් කරන චින්තනය විචාරාත්මක චින්තනයයි" (21st Century Skills A Handbook, 2020). විවේචනාත්මක චින්තනය යනු වෛෂයික විශ්ලේෂණයේ හැකියාවයි. සාධාරණත්වය සහ විවෘත මනස, ක්‍රියාකාරීත්වය සහ දැනුවත් වීම, ප්‍රශ්න කිරීමට හෝ සැක කිරීමට ඇති කැමැත්ත, තක්සේරු කිරීම් හඳුනා ගැනීම, තමන් සමඟ ගනුදෙනු කරන අන් අයගේ පීඩනය හා මාධ්‍යවලින් එන බලපෑම ආදී තොරතුරු හා ගුණාංග ඇතුළත් බව දිල්ලියේ මධ්‍යම ද්විතීක අධ්‍යාපන මණ්ඩලය පවසයි (21st Century Skills A Handbook, 2020).

"වර්තමානයේ ශීඝ්‍ර ආර්ථික හා සමාජ වෙනස්කම් හමුවේ පාසල්වලට සිසුන් සූදානම් කිරීමට නම් මෙතෙක් නිර්මාණය කර නැති රැකියා, මෙතෙක් සොයා නොගත් තාක්ෂණයන් සහ තවමත් අප නො දන්නා ගැටලු යනාදිය අනාගතයේ දී මුහුණ දීමට නම් පුමතිරු බවේ සමානතාව වැදගත් බව පුරුදු

පුහුණු කළ යුතු යැයි” ඇන්ඩ්‍රියාස් ප්ලයිචර් පවසයි. 21 වැනි සියවසේ ඉගෙනුම් පිළිබඳ නූතන උගතුන්ගේ අදහස් ඉතා වැදගත් වේ. ඔවුන් විසින් අදහස් කැටිකොට ගන්නා ලද ග්‍රන්ථයන්හි විඥානවාදී ගුරුකුලකයින් පෙන්වා දෙන පරමදර්ශ වාදයට අනුව “යම් කරුණක් පිළිබඳ දිගින් දිගටම කරනු ලබන තර්කනය හා සංවාද නිසා ඇති වන ප්‍රතිවේදය මගින් ප්‍රඥාව හෙවත් පරම සත්‍ය පහළ වේ” යන්න පෙන්වා දී ඇත (අබේපාල, 2019). ප්ලේටෝ සහ සොක්‍රටීස් වැනි දාර්ශනිකයින් මනසේ ඇති වැදගත්කම සහ චින්තනයේ ඇති වටිනාකම ඉතාම ඉහළින් අගය කර ඇත. ඔවුන් පෙන්වා දෙන්නේ “අදහස් යනු එකම යථාර්ථයයි, දැනගත යුතු එකම දෙයයි” යන්නයි. එයින් අදහස් කරන්නේ යථාර්ථය දැනගත යුතු බවත් එය ඉබේ පහළවන්නක් නොව විචාරාත්මක චින්තනය තුළින් ලැබිය යුත්තක් බවයි. ස්ත්‍රී පුරුෂ සමාජභාවය ඉගැන්වීම් කාර්යේදී වැදගත් වන්නේ කෙසේද යන්න අධ්‍යයනය කිරීමට ප්‍රථම ස්ත්‍රී පුරුෂ සමාජභාවය යන්නෙන් අදහස් වන්නේ කුමක් දැයි පැහැදිලි කර ගත යුතුය.

Gender and Society (1989) ග්‍රන්ථයේ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය (Gender Socialization) පිළිබඳ නිර්වචනය කර ඇත්තේ "ස්ත්‍රීන් සහ පුරුෂයන්ට ප්‍රතික්ෂේපනය කරන සමාජමය කාර්යභාරයන්, ප්‍රවෘත්ති සහ අධිෂ්ඨාන හඳුනා ගැනීමේ ක්‍රියාවලිය යි.” වශයෙනි (Johnson, 1989). ඒ අතර ඉමෝගෙන් රයිට් (2001) විසින් ”පිරිමි සහ ගැහැණු බවට අදාළව සමාජය මඟින් නිර්මාණය කරන ලද මතභේද සහ ක්‍රමවත් ආකල්ප මගින් සමාජීකරණය කරන ක්‍රියාවලියකි.” Wright (2001) ලෙස අර්ථකථනය කරයි. වර්ෂ 1971 දී ආන්ටෝනියෝ ග්‍රාම්ෂි (Antonio Gramsci,) Selections from the Prison Notebooks යන ග්‍රන්ථයේ ස්ත්‍රී පරුෂ සමාජභව අරුත් ගන්වා ඇත්තේ ”වෙනත් භූමිකාවලින් ලිංගික භේදයන් පදනම් කර ගනිමින්, බලය සහ බලහත්කාරය තුළින් ක්‍රියාවලියක් ලෙස ස්ථාපිත කරයි.”යන්නයි. ”සමාජ සාධක මඟින් ස්ත්‍රී පුරුෂ භේදයන් පිළිබඳව පුද්ගලයන්ට දැනුම්දීමේ ක්‍රියාවලියකි.” ස්ත්‍රී පුරුෂ සමාජ බව ලෙස හඩ්සන් සහ බන්ඩුරා (Hudson Bandur, (1992) Social Learning and Gender Development ග්‍රන්ථයේ ප්‍රකාශ කර ඇත එසේම ”ස්ත්‍රී පුරුෂ සමාජභාවය යනු, පුද්ගලයන් ස්වකීය ලිංගිකත්වය හා සමාජය තුළ ඇති ස්ථානය තෝරා ගැනීමට බලපාන ආකල්ප, මූලධර්ම හා බලාපොරොත්තුවල එකතුවකි.” යන්න Doing Gender (1987) ග්‍රන්ථය විස්තර කරයි.

ආගම් සම්බන්ධ අර්ථකතන විවරණය කිරීම සහ ඒවා විශ්ලේෂණය කිරීම. විවිධ ආගමික මතභේදයන් සහ සිද්ධාන්තයන් මත සාකච්ඡා කිරීම, ආගමික පුරුද්දන් සහ විශ්වාසයන් මත විවරණාත්මක අදහස් දැක්වීම, සන්ධාන විකල්ප ගැටළු පිළිබඳව සාධනීය සහ අසාධනීය පාර්ශ්ව විග්‍රහ කිරීම යනාදිය මේ යටතේ විස්තර කළ හැකිවේ. ආගමික විෂය ඉගැන්වීම් කාර්ය සිදු කිරීමේදී ඒ ඒ ආගම්වල ස්ත්‍රීය හා පුරුෂයා කෙරෙහි දක්වන ආකල්ප හෝ ඉගැන්වීම් ඉතා වැදගත් වේ. සොක්‍රටීස් තමන් ළඟට පැමිණෙන සිසුන් ඔහුගෙන් ප්‍රශ්නයක් ඇසූ විට කිසිම විටෙක ඊට පිළිතුරක් ලබා දී නැත. ඒ වෙනුවට ඔහු සිදු කර ඇත්තේ පෙරළා නැවත සිසුවාගෙන් ප්‍රශ්නයක් ඇසීමයි. මේ ආකාරයට ශිෂ්‍යයාගේ චින්තනය පුබුදුවාලීමට සොක්‍රටීස් කටයුතු කර ඇත. ගැටළු සඳහා පිළිතුරු සෙවීමේදී විචාරාත්මක චින්තනය වටිනාකම මේ තුළින් මනාව ඉස්මතුව පෙනේ. පන්ති කාමරයට යන ගුරුවරයා සියල්ල දැනගෙන සිටිය යුතු යැයි සිසුන් සහ සමාජය විශ්වාස කරයි. නමුත් ගුරුවරයා යනු සර්වඥ පුද්ගලයෙකු නොවේ. සිසුන් අසන සෑම ප්‍රශ්නයකටම ගුරුවරයාට පිළිතුරු ලබා දීමට හැකියාවක් නොමැති විය හැකි ය. නොදන්නා ගැටලුවකට වැරදි පිළිතුරු ලබා දීම වෙනුවට ගුරුවරයාට ශිෂ්‍යයාට නිවැරදි පිළිතුර සොයා ගැනීමට චින්තනය මෙහෙයවීම සඳහා මාර්ගය පෙන්වා දිය හැකිය. ඒ සඳහා සොක්‍රටිස්ගේ ප්‍රශ්නකරනය ඉතා වැදගත් වේ (කරුණාසේන, 2018).

පන්ති කාමරය තුළ චින්තනය දියුණු නොවන්නේ නම් එහි අධ්‍යාපනයක් සිදු නොවේ. එහිදී සිදුවන්නේ සිසුන්ට පුහුණුවක් ලබාදීම පමණයි. පන්ති කාමරය තුළදී ශිෂ්‍යයකු විසින් නගන පැනයකට පිළිතුරක් දී එතනින් එම සංවාදය අවසන් කිරීම ඉතාම පහසු කාර්යයක් වුවද එසේ නො කොට ශිෂ්‍යයාගේ නැවත ප්‍රශ්න කරමින් ශිෂ්‍යයා සමඟ සංවාදයේ යෙදෙමින් චින්තනය මෙහෙයවා ශිෂ්‍යයාට ම ගැටළුව සඳහා පිළිතුරු සොයා ගැනීමට පෙළඹවීම ඉතා වැදගත් බව මෙම ගුරුකුලය විසින් පෙන්වා දී ඇත. ගුරුවරයාගේ කාර්යභාරය මෙය විය යුතු බව ඔවුන් පෙන්වා දෙයි.

විවේචනාත්මක චින්තනය යනු විශ්වාසය සහ ක්‍රියාව සඳහා මාර්ගෝපදේශයක් ලෙස නිරීක්ෂණ, අත්දැකීම්, පරාවර්තනය, තර්කනය හෝ සන්නිවේදනය මගින් රැස් කරන ලද, හෝ ජනනය කරන ලද තොරතුරු ක්‍රියාකාරීව සහ දක්ෂ ලෙස සංකල්ප ගත කිරීමේ, යෙදීමේ, විශ්ලේෂණය කිරීමේ, සංස්ලේෂණය කිරීමේ සහ/හෝ ඇගයීමේ බුද්ධිමය විනයානුකූල

ක්‍රියාවලියයි. එහි ආදර්ශවත් ස්වරූපයෙන්, එය විෂය කරුණු බෙදීම් ඉක්මවා යන විශ්වීය බුද්ධිමය වටිනාකම් මත පදනම් වේ. පැහැදිලිකම, නිරවද්‍යතාවය, අනුකූලතාව, අදාළත්වය, හොඳ සාක්ෂි, හොඳ හේතු, ගැඹුර, පළල සහ සාධාරණත්වය. යන්න විවේචනාත්මක චින්තනයේ විශිෂ්ඨත්වය සඳහා ජාතික කවුන්සිලය විසින් නිර්වචනය කරන ලද විවේචනාත්මක චින්තනය (1987), හා 1987 ගිම්හානයේ විවේචනාත්මක චින්තනය සහ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳ 8 වැනි වාර්ෂික ජාත්‍යන්තර සම්මන්ත්‍රණයේදී ඉදිරිපත් කරන ලද මයිකල් ස්ක්‍රිවන් සහ රිචඩ් පෝල්ගේ ප්‍රකාශයෙන් මනාව පැහැදිලි වෙයි.

මයිකල් තෝමස්සේව්ස්කිට අනුව විචාරාත්මක චින්තනයේ (Critical thinking) පියවරයන් ලෙස ගැටලුවක් හෝ ප්‍රශ්නයක් හඳුනා ගැනීම (Identify the problem or question) දත්ත, අදහස් හා තර්ක ගොනු කිරීම (Gather data, opinions, and arguments) දත්ත විශ්ලේෂණය හා ඇගයීම (Analyze and evaluate the data) උපකල්පන හඳුනා ගැනීම (Identify assumptions) සුවිශේෂත්වය ස්ථාපිත කිරීම (Establish significance) තීරණ ගැනීම හා නිගමනවලට එළඹීම (Make a decision/reach a conclusion) ඉදිරිපත් කිරීම හා සන්නිවේදනය කිරීම (Present or communicate) හා ප්‍රශ්නයට අදාළ ගැටලුව හැඳින්වීම (The problem in question) යනුවෙන් කරුණු අටක් (8) දක්වා ඇත.

බුදුදහමට අනුව ප්‍රථමයෙන්ම ගුරුදෙගුරුන් විසින් ශිෂ්‍යයාට විෂය කරුණුවලට පෙර ඉගැන්විය යුත්තේ සාරධර්ම බව "තිළමුට්ඨි ජාතක" (නන්දරතන හිමි, 2021) කතාවෙන් හා ධම්මපදයේ "උට්ඨානවතෝ සතිමතෝ" යන ගාථා පාඨයන්ගෙන් මෙන්ම බොහෝ සූත්‍ර පාඨයන්ගෙන් එය පැහැදිලි කර ගත හැකිය. ඒ සියලු තන්හි විද්‍යමාන වන්නේ විචාරාත්මක බව අධ්‍යාපනයේදී සැලකිය යුතු බවයි. "විද්‍යා දදාති විනයං" අධ්‍යාපනයෙහි මූලික අර්ථය විය යුත්තේ හික්මීමයි. එසේ නොමැතිව විෂය දැනුමෙන් ම පමණක් සාර්ථක, යහපත්, නිර්මාණාත්මක ශිෂ්‍යයකු අධ්‍යාපනය මගින් බිහිකළ නො හැකි බව බුදුසමය අවධාරණය කරයි. විචාරත්මක චින්තනයට අදාළ තවත් ඉගැන්වීම් සමුදායක් දීඝ නිකායේ සිඟාලෝවාද සූත්‍රයෙහි සඳහන් ගුරු-ශිෂ්‍ය සබඳතාව යටතේ සාරධර්ම ලෙස විග්‍රහ කර ඇත. ඒ අතර උත්සාහවන්ත බව, මනා සිහිය, හික්මීම ආදී කුසලතා සංවර්ධනය කළ යුතු බව මනාව විග්‍රහ කර ඇත. එමෙන්ම බුද්දක නිකායේ සුත්ත නිපාතයේ මංගල සූත්‍රයට අනුව "අසේවනාච බාලානං පණ්ඩිතානංච සේවනා" යන්නෙන් ද පැහැදිලි කරනු ලබන්නේ විචාරාත්මකව පුද්ගලයන් ඇසුරු කළ යුතු බවයි. ඒ සඳහා ශිෂ්‍යයා තුළ මූලික නිපුණතා සංවර්ධනය දී යමක් සුවිශේෂත්වය ස්ථාපිත කිරීම හා දත්ත, අදහස් හා තර්ක ගොනු කිරීම තුළින් නො කළ යුතු ක්‍රියාවන් කුමක්ද යන්න අවබෝධ කර ගත යුතු බව බුදුසමයාගත දර්ශනයයි. මේ සෑම ආදර්ශයක්ම පාහේ බුදුරජාණන් වහන්සේ දේශනා කළ වදාළේ ස්ත්‍රී හා පුරුෂ යන ද්විපාර්ශවයන් අළලා වීම මෙහි සුවිශේෂත්වයයි.

බ්‍රාහ්මණ මතවාද හමුවේ දීර්ඝ කාලයක් පීඩනයට පත්ව සිටි භාරතීය කාන්තාවට යම් තරමක හෝ සහනයක් ලද හැකි වූයේ බෞද්ධ යුගයේ උදාවීමත් සමග ය. කාන්තාවන් පිළිබඳ මානව හිතවාදී සාමකාමී දර්ශනයක් ඉදිරිපත් කළ බුදුරජාණන් වහන්සේ ඇය පිළිබඳ පැවති දුර්මත හෙළා දැක සමාජීය වරප්‍රසාදයන් ළඟාකර දීම සඳහා ප්‍රබල උත්සහයක් ගෙන ඇත. ඒ අනුව බුදු දහම මගින් කාන්තාව මවක ලෙස, බිරිදක ලෙස, උපාසිකාවක ලෙස, භික්ෂුණියක ලෙස ක්ෂේත්‍ර කිහිපයක් ඔස්සේ ඇගයුමට ලක් කර ඇත. පුරුෂයා ද එසේමය පියෙකු, ස්වාමියෙකු, උපාසකයෙකු, හා භික්ෂුවක් ලෙස සෑම ක්ෂේත්‍රයක් තුළ ම ස්ත්‍රී පුරුෂ සමාජ භාවය තුළනාත්මක ව පවත්වා ගෙන ඇත.

දුවක ඉපදීම පවා අභාග්‍ය සම්පන්න දෙයක් ලෙස සැලකූ සමාජයකට දුවකගේ ඇති වැදගත්කම පෙන්වා දෙමින් කාන්තාව සමාජයේ වැදගත් කාර්යභාරයක් ඉටු කරන බව බුදුරජාණන් වහන්සේ කෝසල සංයුක්තයේදී මැනවින් විග්‍රහ කර ඇත. දිනක් බුදුරජාණන් වහන්සේ හමුවට ගොස් සිටි කොසොල් රජුට පණිවිඩකරුවෙක් පැමිණ රජුගේ බිසව වූ මල්ලිකා දේවිය දුවක ප්‍රසූත කළ බව දැන්වූයේය. එය ඇසීමෙන් රජු නො සතුටට පත් වූ බව දුටු බුදුරජාණන් වහන්සේ, රජු අමතා දුවගේ ඇති වටිනාකම මෙලෙස පැහැදිලි කර දී තිබේ.

> "ඉත්ථීපි එකච්චියා - සෙය්‍යා පොස ජනාධිප
> මෙධාවිනී සීලවතී - සස්සු දේවා පතිබ්බතා
> තස්සා යො ජායති පොසො සූරො හොති දිසම්පති
> තාදිසා සුභගියා පුත්තො රජ්ජම්පි අනුසාසතීති''
> (මූලය: සංයුක්ත නිකාය 1, 2006)

"රජතුමනි, ඇතැම් ස්ත්‍රිය ද ශ්‍රේෂ්ඨය. ඒ නිසා ඇය හොඳින් පෝෂණය කරන්න. නුවණැති සිල්වත් නැදිමයිලන් දෙවි කොට වෙසෙන පතිවත රක්නා

(යම් ස්ත්‍රියක් වේද) දිසාවන්ට අධිපති රජතුමනි, ඇයට යම් පුතෙක් උපදීද (හෙතම) දක්ෂයෙක් වෙයි. එබඳු යහපත් තැනැත්තියගේ පුත්‍ර තෙමේ රාජ්‍යානුශාසනාද කෙරෙයි" යැයි වදාළ සේක. මේ මගින් බුදුරජාණන් වහන්සේ කාන්තාව හා පුරුෂයා යන දෙදෙනාගේ වටිනාකම එකහා සමාන බව අවධාරණය කර ඇත. එමෙන් ම සැම තැනකදී ම පුරුෂයා පමණක් නුවණින් යුතු නොවන බවත් ඇතැම් අවස්ථාවන්හිදී ස්ත්‍රිය ද ප්‍රඥාවෙන් යුතු තැනැත්තියක් වන බව ද බෞද්ධ සාහිත්‍යයේ දැක්වේ.

"න සෝ සබ්බේසු ඨානේසු - පුරිසෝ හෝති පණ්ඩිතෝ ඉත්ථිපි පණ්ඩිතා හොන්ති - තත්ථ තත්ථ විචක්ඛණා" (මූලය: ඛුද්දක නිකාය, 2006)

යනුවෙන් කුණ්ඩල කේසාථෙරී අපදානයේ සඳහන් වන්නේ විශේෂයෙන් මවක ලෙස සිය පවුලේ, සමාජයේ යහ පැවැත්ම උදෙසා ඇය ඉටු කරන්නා වූ කාර්ය භාරය සුළු පටු නොවන බවයි. බ්‍රාහ්මණ මතය අනුව මනුෂ්‍ය වර්ගයාගේ උපත තීන්දු කෙරෙනුයේ මහා බ්‍රහ්මන් නමැති සර්වබලධාරී දෙවියන් විසිනි. එහෙත් බුදුරජාණන් වහන්සේ මෙම මිථ්‍යා මතය බැහැර කරමින් දරුවකු බිහි කිරීමේ ගෞරවය කාන්තාව වෙත ලබා දී ඇත. මවු පදවිය ලැබීමේ වාසනා ගුණයෙන් සපිරි කාන්තාවන් උත්තමියන් කොට පිදුම් ලැබිය යුතු බව බෞද්ධ මතය විය.

පියා පමණක් නොව මව ද දරුවන්ගේ පූර්ව ආචාර්ය වේ. තම දරුවන්ට ගෙදර සිටින හොඳම මිත්‍රයා මව ය. මවක් තම දිවි දෙවැනි කොට ස්වකීය දරුවා රැකබලා ගන්නීය. එපමණක් නොව මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා යන සතරාකාරයේ බ්‍රහ්ම ගුණවලින් යුත් තැනැත්තන් ලෙස පියා හා මව යන දෙදෙනාම බුදු දහමේ ඇගයීමට ලක් කර ඇත. මෙලෙස මවකගේ ඇති උතුම් ගුණාංග හා ඇයගෙන් ඉටු වන සුවිශාල සමාජ මෙහෙවර පිළිබඳ ව සලකමින් කාන්තාව සමාජයේ ගෞරවයට ලක් විය යුතු බව බුදු දහමින් විචාරාත්මක චින්තනීය සාධක සහිතව අවධාරණය කොට ඇත.

සිගාලෝවාද සූත්‍රයෙහි ද සදිසා නමස්කාරයෙහි "මාතා පිතා දිසා පුබ්බා" (දීඝ නිකාය 111, 2006) යනුවෙන් නැගෙනහිර දිශාව ලෙස දක්වා ඇත්තේ මවු පිය දූ දරු සබඳතාව ය. මෙහිදී ද මවු-පිය යන්නෙන් පියාට පමණක් නොව මව ද අවධාරණය කර ඇත්තේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය බුදු දහමින් අවධාරණය කරමිණි. මවගේ ඇති වටිනාකම මනාව අවබෝධ කරගත් බුදුන් වහන්සේ සිය චරිතාදර්ශයෙන් ම ඒ බව පසක් කර ඇත. මහාමයා දේවිය කළුරිය කළ පසු තව්තිසා දෙව්ලොවට ගොස් මාතෘ දිව්‍ය රාජයාට දහම් දේශනා කිරීම, සුළු මව වූ ප්‍රජාපතී ගෝතමිය පිරිනිවන් පාන්නට යන අවස්ථාවේ පසු ගමන් කිරීම, සුදෝවුන් රජුට ධර්මය දේශනා කිරීමට කිඹුල්වත් නුවරට වැඩම වීම ආදි සිද්ධීන් ස්ත්‍රී පුරුෂ සමාජභාවය නිදසුන් ලෙස දැක්විය හැකි ය. ඒ අනුව ලිංග භේදය මුල් කර ගනිමින් සිදු කරන්නා වූ කිසිදු බෙදීමක් බුදු දහම මගින් අනුමත කර නොමැති බව පැහැදිලි වෙයි.

මවුපියන්ට ගරු කරන්නා දියුණුවට පත් වන බවත් මවුපියන්ට ගරු නො කරන්නා පරිහානිය කරා යන බවත් බෞද්ධ සූත්‍ර දේශනා ගණනාවකින් පැහැදිලි කර තිබේ. "මාතා පිතු උපට්ඨානං" (ඛුද්දක නිකාය, 2006) යනුවෙන් මව්පියන්ට උපස්ථාන කිරීම දෙලොව දියුණුව සඳහා අනුබල දෙන මංගල කරුණක් බව මංගල සූත්‍රයෙහි දැක්වේ. පරාභව සූත්‍රයේදී '' යෝ මාතරං වා පිතරං වා- ජිණ්ණකං ගත යොබ්බනං.." (ඛුද්දක නිකාය, 2006) යනුවෙන් ද එසේම අන්ගුත්තර නිකාය තිකනිපාතපාළියේ (7) 2 මහාවග්ගයේ කාලාම සූත්‍රය ද සංයුක්ත නිකායේ සළායතන වග්ගපාළි තාලපුට සූත්‍රය ද මජ්ඣිමනිකාය මූලපණ්ණසපාළියේ චූළයමකවග්ගයේ වීසංසන සූත්‍රයේ ද අන්තර්ගත සාහිත්‍ය අධ්‍යයනයෙන් මඟ පෙන්වනු ලැබීය. ගැටලුවක් හෝ ප්‍රශ්නයක් හඳුනා ගැනීම, දත්ත, අදහස් හා තර්ක ගොනු කිරීම, දත්ත විශ්ලේෂණය හා ඇගයීම, උපකල්පන හඳුනා ගැනීම, සුවිශේෂත්වය ස්ථාපිත කිරීම, තීරණ ගැනීම හා නිගමනවලට එළඹීම, ඉදිරිපත් කිරීම හා සන්නිවේදනය කිරීම හා අදාළ ගැටලුව හඳුනා ගැනීම. යනුවෙන් කොටස් අටක් විචාරාත්මක චින්තනය නියෝජනය කරන්නක් බව මයිකල් තෝම්වෙයිස්කි පවසයි. එයට අනුව ඉගෙනුම් ඉගැන්වීම් කාර්ය කිරීමේදී ගුරුවරයාට සේම ඉගෙනුම්ලාභියාට විචාරාත්මක චින්තනය සංවර්ධනය කර ගැනීම සඳහා ඉහත පියවර අනුගමනය කිරීම වැදගත් හෙයින් මෙම දාර්ශනිකයාගේ නිර්වචනය යොදා ගනු ලැබීය.

ආගමික විෂයමාලාව සැකසීමට විෂය ක්ෂේත්‍රය තුළ නූතන අධ්‍යාපන විද්‍යාවට අනුව ශිෂ්‍යයෙකු ළඟා කර ගත යුතු කුසලතා ඇති කිරීම සඳහා විෂය ලබා දීමේදී අවධාරණයට ලක් කළ යුතු අංශ කිහිපයකි. එහිදි ශිෂ්‍ය සාධනය ප්‍රධාන වේ. ශිෂ්‍ය සාධනය යනු අපේක්ෂිත ඉගෙනුම් අත්දැකීම් කරා ශිෂ්‍යයා ළඟා වී ඇතිද යන්නයි. බි. එස්. බ්ලූම්ගේ (1956) හා ඇන්ඩර්සන්ගේ (2000), ප්‍රජානන ක්ෂේත්‍රයේ

වර්ගීකරණයට අනුව විවිධ ක්ෂේත්‍රයන් ආවරණට වන පරිදි ආගමික ඉගැන්වීම්වල කේන්ද්‍රීය හා වාස්තවික බව නියෝජනය වන අයුරින් ඉගැන්විය යුතුය. එහිදී ප්‍රජානන ක්ෂේත්‍රය දැනුම, අවබෝධය, භාවිතය, විශ්ලේෂණය, සංස්ලේෂණය හා ඇගයීම දක්වාත් ඇන්ඩර්සන්ට (2001) අනුව නිර්මාණය දක්වාත් ඉගෙනුම්ලාභියා තුළ කුසලතා සංවර්ධනය කළ යුතුය.

එමෙන්ම ආවේදන ක්ෂේත්‍රය ඩී. ආර්. ක්‍රැත්වෝල් ඇතුලු පිරිසට අනුව ග්‍රහණය, ප්‍රතිචාරණය, අගය පැවරීම,සංවිධානය හා චරිතායනය යන අංග සේම මනෝචාලක ක්ෂේත්‍රය සඳහා ඊ.ජේ. සිම්ප්සන්ගේ වර්ගීකරණයට අනුව සංජානනය, සූදානම, මාර්ගෝපදේශිත ප්‍රතිචාර, යාන්ත්‍රණය, සංකීර්ණ ප්‍රකාශිත ප්‍රතිචාර, සමායෝගය හා නිර්මාණය යන සියලුම අංශ සංවර්ධනය තුළින් සමබර පෞරුෂයකින් යුතු දරුවකු සමාජයට අධ්‍යාපනයෙන් දායාද කළ යුතු බව අවධාරණය කර ඇත.

සාරධර්ම ඉගැන්වීමේදී ස්ත්‍රී පුරුෂ සමාජභාවය කෙබදුද හා ශිෂ්‍යය ශීෂ්‍යාවන්ගෙන් බලාපොරොතුත්තු වන්නේ කුමක් ද යන්න දීඝ නිකායේ සිඟාලෝවාද සූත්‍රයෙහි ගුරු-ශිෂ්‍ය සම්බන්ධතා යටතේ අපූර්වත්වයෙන් පෙළ ගස්වා ඇත. මෙමගින් ශිෂ්‍යයෙකුට ගැටලුවක් හෝ ප්‍රශ්නයක් හඳුනා ගැනීම හා එම ගැටලුව නිරාකරණය කර ගැනීම සඳහා නිවැරදි මග පෙන්වීම තුළින් ගුරුවරයෙකු විසින් පිළිපැදිය යුතු හා ශිෂ්‍යයෙකු විසින් අනුගමනය කළ යුතු පිළිවෙත් ඉදිරිපත් කර ඇත. එම සියලු කාරණාවලින් ඉස්මතු වන්නේ විචාරාත්මකව යමක් දෙස බැලිය යුතු බවයි. එසේම ගුරුවරයා හෝ ශිෂ්‍යයා එක් ලිංග පාර්ෂවයක් පදනම් කර ගෙන මෙම දේශනා සිදු කර නැත. ඒ සෑම අවස්ථාවකදීම පොදු නාමය භාවිත කර ඇත්තේ එහි ස්ත්‍රී පුරුෂ සම සමාජභාවය පිළි ගැනීම අනුව වීමත් බෞද්ධාගමේ විශේෂත්වයයි.

බුදුරජාණන් වහන්සේ සමාජයට ඉදිරිපත් කළේ පටිච්ච සමුප්පාද න්‍යාය පදනම් කරගත් ඉගෙනුම් සමුදායකි. අන්තගාමී ඉගැන්වීම්වලින් බැහැර වූ මධ්‍යම ප්‍රතිපදාවට අනුගත දහමකි. ඒ නිසා මෙම අභිනව දර්ශනය ඉතා ම කෙටි කාල සීමාවක් තුළ කිසිදු ලිංග භේදයකින් තොරව ජනතා ප්‍රසාදයට ලක් විය. දෛනික ව විශාල පිරිසක් මෙම දර්ශනය වටා ඒකරාශී වූහ. ඒකරාශි වන පිරිසගේ බුද්ධි මට්ටම, මානසික ස්වභාවය, දෘෂ්ටිමය පදනම, සාමාජික පරිසරය ආදිය සැලකිල්ලට ගෙන ශාස්තෘවරයකු, ගුරුවරයකු වශයෙන් බුදුරජාණන් වහන්සේ විවිධ පර්යායන් අනුගමනය කරමින් උපාය කෞශල්‍යයෙන් යුතු ව දහම් දෙසූහ. ඒ සඳහා යොදාගත් විචාරශීලී චින්තනයෙන් යුතු ඉගැන්වීම් ක්‍රම ගණනාවක් පැවැතිණි. එම ක්‍රම අනුගමනය කිරීමේදී ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සම තැන සියල්ලන්ටම ලබා දීම බුදු දහමේ සුවිශේෂතාවයකි.

1. ඍජු දේශනා ක්‍රමය :- ඒ ඒ පුද්ගලයාට, පුද්ගල සමූහයට අදාළ වූ අනුරූපී වූ ධර්ම කොට්ඨාසයන් එක එල්ලේ ම දේශනා කිරීම ඍජු දේශනා ලෙස සැලකෙන අතර නිදසුන් වශයෙන් දම්සක් පැවැතුම් සූත්‍රය දැක්විය හැකි ය.
2. සාකච්ඡා ක්‍රමය :- බුදුරජාණන් වහන්සේ තම ශ්‍රාවක පිරිස සමඟත් අන්‍ය ආගමික පිරිස් සමඟත් කරන සාකච්ඡා ස්වරූපයෙන් දහම් දෙසූ අවස්ථා දැක ගත හැකි ය. සන්දක සූත්‍රය, කන්දරක සූත්‍රය මේ සඳහා නිදසුන් ලෙස ගත හැකි ය.
3. උපමානුසාරී දේශනා ක්‍රමය :- ඒ ඒ පුද්ගලයාට තේරුම් ගැනීමට පහසු වන පරිදි විවිධ උපමා ඉදිරිපත් කරමින් ධර්මය දේශනා කිරීම සුලභ ලක්ෂණයක් විය. අම්බලට්ඨික රාහුලෝවාද, කසීභාරද්වාජ වැනි සූත්‍ර මෙන් ම ධම්ම පදයේ දැක්වෙන ගාථාවල සඳහන් උපමා ද මේ සඳහා නිදසුන් වේ.
4. පැවරුම් ක්‍රමය :- ධර්මය දේශනා නොකොට ශ්‍රාවකත්වයට පත් වීමට සිටින අයට ම අවබෝධය ඇති වන පරිදි කිසියම් කාර්යක නිරත කරවීම බුදුන් වහන්සේගේ දේශනාවන් අතර විශේෂ වූවකි. චුල්ලපන්ථක තෙරුන් හා සම්බන්ධ කතා පුවත හා කිසාගෝතමී හා සම්බන්ධ කතා පුවත නිදසුන් වශයෙන් දැක්විය හැකි ය.

බුදුරදුන්ගෙන් ප්‍රශ්න ඇසීමට විවිධ උගත්තු හා නා නා තරාතිරමේ ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවය ම පැමිණියහ. ඔවුන් ඉදිරිපත් කළ ප්‍රශ්නවලට අනුකූල වන පරිදි සිවු වැදෑරුම් ක්‍රමයකට ප්‍රශ්න විසඳූ අයුරු ඇතැම් සූත්‍ර ධර්ම අධ්‍යයනය කිරීමේ දී අනාවරණය වේ.

"අත්ථි භික්ඛවේ පඤ්හෝ ඒකාංස ව්‍යාකරණීයෝ විභජ්ජ ව්‍යාකරණීයෝ පටිපුච්ඡා ව්‍යාකරණීයෝ ඨපනීයෝ" (අංගුත්තර නිකාය ii, 2006)

1. ඒකාංස ව්‍යාකරණීය:- ඇසූ ප්‍රශ්නයකට එක එල්ලේ ම පිළිතුරු ලබාදීමේ ක්‍රමයක් මේ මගින් ගම්‍යමාන කෙරේ. (උද.ආලවක සූත්‍රය)
2. විභජ්ජ ව්‍යාකරණීය:- මෙයින් අදහස් කෙරෙන්නේ අදාළ ප්‍රස්තුතය හෝ ධර්ම

කාරණය හෝ විශ්ලේෂණය කොට බෙදා ඒ ඒ කොටස්වලට නිසි පරිදි පිළිතුරු ලැබෙන සේ දේශනා පැවැත්වීම යි. (උදා. සච්ච විභංග සූත්‍රය, මහා හත්ථිපදෝපම සූත්‍රය)

3. පටිපුච්ඡා ව්‍යාකරණීයඃ- බුදුරදුන්ගෙන් ප්‍රශ්නයක් විමසූ කල ඇතැම් අවස්ථාවන්හි දී ඊට සමාන ප්‍රශ්නයක් අසා එයට ලැබෙන පිළිතුර අනුව ධර්ම කරුණු විවරණය කිරීම. (උදා. චූල්ල සච්චක සූත්‍රය)

4. ඨපනීයඃ- ප්‍රායෝගික නොවන වැදගත්කමක් නොමැති ප්‍රශ්න බුදුරදුන්ගෙන් යමක් විමසා සිටිය හොත් එවැනි ප්‍රශ්නවලට බුදුරදුහු පිළිතුරු ලබා නොදුන්හ. එසේ පිළිතුරු ලබා නො දුන් ප්‍රශ්න ඨපනීය නම් වේ. (උදා. චූල්ල මාලුංක්‍ය සූත්‍රය)

මීට අමතර ව බුදුරජාණන් වහන්සේ ධර්ම දේශනා කිරීමේදී යොදාගත් ක්‍රම හතරක් පිළිබඳව අටුවා සාහිත්‍යයෙහි ද තොරතුරු දැක්වේ.

1. අත්තජ්ඣාසය - තමන් වහන්සේගේ අදහස අනුව සුදුසු ධර්මයක් දේශනා කිරීම. (උදා. දම්සක් පැවතුම් සූත්‍රය)
2. පරජ්ඣාස - ශ්‍රාවකයාගේ අපේක්ෂාව අනුව දහම් දෙසීම. (උදා. අරියපරියේසන සූත්‍රය)
3. අට්ඨුප්පත්තික - අර්ථය පැහැදිලි කිරීම සඳහා දහම් දෙසීම. (උදා. සිගාලෝවාද සූත්‍රය)
4. පුච්ඡාවසික - ප්‍රශ්නයකට පිළිතුරු දීමක් වශයෙන් දහම් දෙසීම. (උදා. මංගල සූත්‍රය)

මීට පරිබාහිර වූ තවත් දේශනා ක්‍රම රැසක් තම ශ්‍රාවක ශ්‍රාවිකාවන්හට ධර්ම දේශනා කීමේ දී බුදුරජාණන් වහන්සේ යොදා ගත්හ. විශේෂයෙන් ආනුපුබ්බී කථා ක්‍රමය හෙවත් අනුපිළිවෙළ ක්‍රමය (දාන කථා, සීල කථා, සග්ගකථා ආදි වශයෙන්), සාමුක්කංසික දේශනා ක්‍රමය හෙවත් ගැඹුරු වූ ධර්මයක් දේශනා කිරීමේ දී යොදාගනු ලබන ක්‍රමවේදය (චතුරාර්ය සත්‍ය, පටිච්ච සමුප්පාදය වැනි මූලික දේශනා), ප්‍රහේලිකා ක්‍රමය, ශ්‍රව්‍ය දෘශ්‍ය උපකාරක අවස්ථා යොදා ගැනීම ආදි වශයෙන් සඳහන් වන්නේ ද එයින් කිහිපයකි. මුලින් සඳහන් කළ ආකාරයට ශාස්තෘවරයා යනු මෙලොව, පරලොව, නිවන යන ත්‍රිවිධාර්ථය ම සාධනය වන අයුරින් දෙව් මිනිසුන් යන දෙපිරිසට ම අනුශාසනා කරන්නා ය. මේ සියලු ම දේශනා ක්‍රම බුදුරදුන් විසින් භාවිත කරනු ලැබුවේ එම අරමුණ ඉටු කර ගැනීම උදෙසා වන අතර කිසිදු ලිංග භේදයකින් තොව ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයටම සම තැන ලබා දෙමිණි.

බුදුරජාණන් වහන්සේ තුළ පැවැති ආධ්‍යාත්මික ගුණාංගයන් ගෙන් ද ප්‍රකට කෙරෙනුයේ විචාරශීලි ලක්‍ෂණ ය. එනම්, කරුණාව, මෛත්‍රිය, ඉවසීම, තාදී ගුණය යන කරුණු එකිනෙක විමර්ශනාත්මක ව අධ්‍යයනය කිරීම මඟින් ඒ බව වටහා ගත හැකි ය. එසේ ම බාහිර වශයෙන් ක්‍රියාත්මක වෙමින් බුදු සිරිත ආලෝකවත් කළ නිදහස් චින්තනයට හා වීමංසනයට ඉඩ ලබාදීම, යථාවාදී තථාකාරී ගුණය, අන්‍ය ආගම් කෙරෙහි දැක්වූ සුහද ආකල්පය, පුද්ගල ස්වාමිත්වය හා තම විමුක්තිය තමා වෙත ම පවරාදීම මඟින් ද ප්‍රකට කෙරෙනුයේ බුදුරදුන්ගේ විචාරාත්මක චින්තන කුසලතාවයි. එහිදී ස්ත්‍රී පුරුෂ බේදයකින් තොරව ආධ්‍යාත්මිකතාව අගය කළහ.

බුදුරජාණන් වහන්සේ මානුෂීය ලක්‍ෂණ ප්‍රකට කළ සැබෑ ඉතිහාසයක් ඇති ශාස්තෘවරයෙක් වූහ. කිසි විටෙකත් දෙවියකු, දේව දූතයකු, බ්‍රහ්මයකු හෝ අදෘශ්‍යමාන බලවේගයක් ලෙස පෙනී නොසිටියහ. යෝනිසෝ මනසිකාරයෙන් සිය ඥාන ශක්තිය මෙහෙයවා ධර්මාවබෝධය ලබාගෙන සෙස්සන්ට එම මාර්ගය පෙන්වා දුන්හ. ඒ නිසා ම ශාස්තෘවරයකු වශයෙන් බුදුරදුන් පිළිබඳ ව දෙව් මිනිස් බොහෝ දෙනා පැහැදුනහ. එසේ පැහැදී උන් වහන්සේ ප්‍රශංසාවට, ඇගැයීමට ලක් කළ පුරුෂයන් මෙන්ම ස්ත්‍රීන්ද සිටීම විශේෂත්වයකි. නිදසුන් ලෙස පටාචාර, රජ්ජුමාලා, වැනි අසරණ කාන්තාවන් සේම මහාප්‍රජාපති, භද්ධකච්ඡායනා ආදී උසස් කුලවල කාන්තාවන් ද විය.

"තං ඛෝ පන භගවන්තං ගෝතමං ඒවං කල්‍යාණෝ කිත්ති සද්දො අබ්භුග්ගතෝ 'ඉතිපිසෝ භගවා අරහං සම්මා සම්බුද්ධෝ, විජ්ජාචරණ සම්පන්නෝ සුගතෝ ලෝකවිදූ අනුත්තරෝ පුරිසදම්ම සාරථී සත්ථා දේව මනුස්සානං බුද්ධෝ භගවාති........' (දීඝ නිකාය i, 2006)

ඒ භාග්‍යවතුන් වහන්සේ මේ කරුණින් අරහත් ය, සම්මා සම්බුද්ධ ය. විජ්ජාචරණ සම්පන්න ය, සුගත ය, ලෝකවිදූ ය, අනුත්තර පුරිසදම්ම සාරථී ය, දෙව් මිනිසුන්ට ශාස්තෘ ය, බුද්ධ ය, භාග්‍යවත් වූ බුදුරජාණන් වහන්සේ පිළිබඳ ව කල්‍යාණ වූ කීර්ති ශබ්දය උස් වැ නැංගේය" යනු එහි අදහස යි.

"අභික්කන්තං භෝ ගෝතම, අභික්කන්තං භෝ ගෝතම සෙය්‍යථාපි භෝ ගෝතම නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය....." (සුත්ත නිපාතය, 2006)

ආදි වශයෙන් දහම් අසා සතුටටත් ප්‍රසාදයටත් පත් වූවෝ පැවසූහ. ස්වාමීනී භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේගේ ධර්ම දේශනය ඉතා යහපත් ය. යම් සේ යටිකුරු වූවක් උඩුකුරු වූවක් කොට දක්වන්නේ ද, වැසී තිබූ දෙයක් විවර කොට පෙන්වන්නේ ද අඳුරෙහි පහනක් දල්වා ඇස් ඇත්තවුන්ට රූප දක්වනුයේ ද මං මුළා වූවකුට මඟ කියන්නේ ද, එලෙසින් ම භගවත් ගෞතමයන් වහන්සේ විසින් නොයෙක් පර්යායෙන් දහම් දෙසන ලද්දේ ය. එසේ වර්ණනා කරනු ලැබුවේ ද බුදුරජාණන් වහන්සේගේ ශ්‍රේෂ්ඨ ශාස්තෘත්වය පදනම් කරගෙන ය ඉස්මතු වී පෙනුන විචාරාත්මක චින්තන කුසලතාවයේ අපූර්වත්වය සේම ස්ත්‍රී පුරුෂ සමජභාවය සඳහා සම තැන ලබා දීම හේතුවෙනි. විශ්ව සමාජය විසින් පිළිගන්නා ලද හෝ මෙම සම්මතයට අදාළ මූලික මිනිස් අයිතිවාසිකම් බෞද්ධයන් විසින් පිළිගනු ලැබ ක්‍රියාත්මක කරගෙන එනු ලබන්නේ දැනට සියවස් විසිපහකට පමණ පෙර සිට ය. ඒ බව තෙවළා බුදු දහම අධ්‍යයනය කරන හැම අයකුට ම පසක් වේ.

"අනුවිච්චකාරං බෝ ගහපති කරෝහි. අනුවිච්චකාරෝ තුම්හාදිසානං ඤාතමනුස්සානං සාධු හෝතීති." (මජ්ඣිම නිකාය ii, 2006)

"ගෘහපතිය, ඔබ වැනි අය විමසා කටයුතු කළ යුතු ය. විමසා බලා ක්‍රියා කිරීම ඔබ වැනි ප්‍රසිද්ධ පුද්ගලයන්ට වඩාත් වැදගත් වේ" යනුවෙන් බුදුරදුන් මෙම ප්‍රකාශය කළේ නිගණ්ඨනාත පුත්තගේ ප්‍රබල අනුගාමිකයකු වූ උපාලි ගෘහපති අරබයා ය.

නිදහස් චින්තනයට යොමු වී හොඳ නරක, කුසලය අකුසලය හරි වැරදි තෝරා ගැනීමට මඟ පෙන්වන තවත් වැදගත් සූත්‍රයක් ලෙස කාලාම සූත්‍රය සැලැකේ. බුදුරදුන් මෙම සූත්‍රය දේශනා කළේ කේසපුත්ත ගම් වැසි කාලාමවරුන්ට ඇති වූ ගැටලුවකට ලබා දුන් පිළිතුරක් වශයෙනි. එහිදී ඔවුන්ගේ ගැටලුව වූයේ තම ගමට විවිධ ආගමික මතවාදයන් ගත් පිරිස් පැමිණෙන බවත් ඒ අය තම වාදය හුවා දක්වමින් සෙසු ආගමික ඉගැන්වීම් ගර්හාවට ලක් කරන බවත් ය. ඔවුන් අතරෙන් කවුරු සත්‍ය ප්‍රකාශ කරත් ද කවුරු අසත්‍ය ප්‍රකාශ කරත් දැයි ගැටලුවක් පවතින බව කාලාමවරු පැවසූහ. එවිට බුදුරදුන්ගේ පිළිතුර වූයේ කාලාමයන්ගේ සැකය නිවැරදි බවත්, යමක් පිළිගැනීමේදී ආත්ම විශ්වාසය නැත්තවුන් යොදා ගන්නා නිසරු මිනුම් බැහැර කළ යුතු බවත් ය. එදා සමාජය තුළ භාවිත නිසරු මිනුම් දහයක් කාලාම සූත්‍රය මගින් බැහැර කර ඇත.

1. මා අනුස්සවේන - යමක් ඇසූ පමණින් නො පිළිගත යුතු ය.
2. මා පරම්පරාය - පරම්පරාවෙන් පැවත එන නිසා නො පිළිගත යුතු ය.
3. මා ඉතිකිරාය - මෙය මෙසේ වී යැයි ආරංචි මාත්‍රයෙන් හෝ නො පිළිගත යුතු ය.
4. මා පිටකසම්පදානේන- පොත්පත්වල පැවති හෙයින් නො පිළිගත යුතු ය.
5. මා තක්කහේතු - තර්කයට ගැළැපෙන පමණින් හෝ නො පිළිගත යුතු ය.
6. මා නය හේතු - න්‍යායට ගැළපෙන පමණින් හෝ නො පිළිගත යුතු ය.
7. මා ආකාරපරිවිතක්කේන- තමා සිතූ ආකාරයට ගැළැපෙන පමණින් ද නො පිළිගත යුතු ය.
8. මා දිට්ඨි නිජ්ඣානඛන්තියා - තම දෘෂ්ටියට ගැළැපෙන පමණින් ද නො පිළිගත යුතු ය.
9. මා භබ්බරූපතාය - මා වැන්නකු මෙසේ පිළිගැනීම සුදුසු යැයි ද නො පිළිගත යුතු ය.
10. මා සමණෝ නොගරුත - මේ ශ්‍රමණයෝ අපගේ ගුරුවරයෝ යැයි කියා හෝ යමක් නො පිළිගත යුතු ය. (අංගුත්තර නිකාය i, 2006)

නිදහස් චින්තනය හා විචාරශීලි චින්තනය අනුව යමක් වැරදි ද, නිවැරදි ද නුවණැත්තන්ගේ පැසසුමට ලක් වේ ද ගර්හාවට ලක් වේ ද මෙහි ප්‍රතිඵලය හොඳ ද නරක ද යන කරුණු තමන් විසින් ම විමසා බලා යමක් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම හෝ කළ හැකි බවට ස්ත්‍රී පුරුෂ සමාජභාවය බාධාවක් නොවන බව, බුදුරජාණන් වහන්සේගේ ඉගැන්වීම විය. මේ ඉගැන්වීම මගින් බුදුරදුන් පුද්ගලයා ගතානුගතික චින්තනයෙන් නිදහස් කරගෙන ස්වාධීන ව තීරණ ගෙන කටයුතු කිරීමට යොමු කළ අයුරු දක්නට ලැබේ.

බුදු සමයෙන් ඉදිරිපත් කෙරෙන නිදහස් චින්තනය ප්‍රකට කිරීමට ස්ත්‍රී පුරුෂ සමාජ භාවය බාධාවක් නොවන බව අවධාරණය කරන තවත් අවස්ථාවක් සතර මහාපදේශ මගින් ද දැකිය හැකි ය. මෙමඟින් ද ශ්‍රාවකයාට සාවද්‍යතාව හා නිරවද්‍යතාව හඳුනා ගැනීම සඳහා තමාගේ ම බුද්ධිය භාවිත කරලීමට අවසරය ලබාදුන් ආකාරයක් දක්නට ලැබේ.

1. මේ ධර්ම විනය මා විසින් බුදුරදුන්ගෙන්ම අසාගන්නා ලදැයි කීව ද?
2. මහා සංඝයා වහන්සේලාගෙන් අසාගත්හ, ලදැයි කිව ද?

3. බොහෝ භික්‍ෂූන් වහන්සේලාගෙන් අසාගත්හ, ලද්දයි කිව ද?
4. ධර්ම විනයධර මතිකාධර භික්‍ෂු නාමකගෙන් අසාගන්නා ලදැයි කීව ද? (දීඝ නිකාය ii, 2006)

මෙම ඉගැන්වීම අනුව සාමාන්‍ය පුද්ගලයකු පමණක් නො ව විශේෂිත අයකු යමක් කී පමණින් නො පිළිගත යුතු බව අවධාරණය වෙයි. අවම වශයෙන් ශාසනයේ ශාස්තෘන් වහන්සේ කළ දේශනයක් වුව ද එක වර නො පිළිගෙන විචාරශීලී ව බැලීමට යොමු කරවීම මගින් බුදු සමය චින්තන නිදහස කොතරම් අගය කර ඇත් ද යන්න හඳුනා ගැනීම අපහසු නො වේ. එබඳු ප්‍රකාශයක් කළ ශාස්තෘවරයකු ලොව මෙතෙක් පහළ වී නැති තරම් ය. එකල සමාජයේ බොහෝ ආගමික පිරිස් ප්‍රකාශ කර සිටියේ මෙය පමණක් සත්‍ය ය, සෙසු සියල්ල අසත්‍ය ය යනුවෙනි. "ඉදමේව සච්චං මෝඝ මඤ්ඤං" යන ප්‍රකාශයෙන් එය තහවුරු වේ. එම ඉගැන්වීමට වඩා ස්වාධීන ඉගැන්වීමක් බුදුරදුන් ඉදිරිපත් කර ඇති අයුරු මෙම සතර මහාපදේශ විමසා බැලීමෙන් තහවුරු වේ.

බුදු දහමේ චින්තන නිදහස පිළිබඳ ව කරන අධ්‍යයනයන්හිදී විමසා බැලීමේ නිදහස ද ඇගයීමට ලක් කෙරේ. බුදුරදුන් තමන් වහන්සේ පිළිබඳ ව ද තමන් වහන්සේගේ ධර්මය පිළිබඳ ව ද විමසා බැලීමෙන් තොර ව එක වර නො පිළිගත යුතු බවත් පරචිත්ත විජානන ඥානය නොමැති වූවන් විසින් තථාගතයන් වහන්සේ පිළිබඳ ව ද සොයා බලා පිළිගත යුතු බවත් වීමංශක සූත්‍රයෙහි දක්වා ඇත.

> "වීමංසකේන භික්ඛවේ භික්ඛුනා පරස්ස චේතෝපරියායං අජානන්තේන තථාගතෝ සමන්නේසනා කාතබ්බා සම්මා සම්බුද්ධෝ වා නෝවා ඉති විඤ්ඤාණායාති." (මජ්ඣිම නිකාය i, 2006)

නිදහස් චින්තනයට බාධා පමුණුවමින් තම ආගමික මතවාදය ම පිළිගන්නා ලෙස බලපෑම් නො කිරීම බුදු දහමේ විශේෂ ලක්ෂණය වේ. යමක් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම හෝ නිදහස් මනසකින් විචාරපූර්වක ව සිදු කළ යුතු ය යන්න බුදු දහම අවධාරණය කරයි. විචාරපූර්වක ව ක්‍රියා නො කරන්නාගේ ආධ්‍යාත්මික ප්‍රගතියක් ඇති නො වන බව "න චින්තයන්තෝ පුරිසෝ විසේසමධිගච්ඡති" යන්නෙන් පැහැදිලි කෙරේ. මේ ආකාරයට නිදහස් චින්තනයට හා විමසීමට අදාළ ඉගැන්වීම් සමුදායක් සූත්‍ර ධර්ම මගින් හඳුනා ගත හැකි ය.

විචාරාත්මක චින්තනයේදී ශිෂ්‍යයාගේ ස්වභාවය හා භූමිකාව ද ඉගෙනුම් කියාවලියේදී අතිශයින් වැදගත් වන සේ ම ශිෂ්‍යාගේ ස්වභාවය දැන ඉගැන්වීම ඉතා වැදගත් වේ. අසන්නා තුළ ඇති දුර්වලතා බුදු සමය මෙසේ පෙන්වා දී ඇත (අංගුත්තර නිකාය, 2006).

අසන්නට නො පෙළඹීම (න සුස්සූසති), ඇසුව ද මැනවින් සවන් යොමු නො කිරීම (න සොතං ඔදහති), දැන ගැනීමට සිත යොමු නො කිරීම (න අඤ්ඤා චිත්තං උපට්ඨපෙති), වරදවා තේරුම් ගැනීම (අනත්ථං ගණ්හාති), සැබෑ අර්ථය බැහැර කිරීම (අත්ථං රිඤ්චති), අනුලෝමික රුචිකත්වයක් නො දැක්වීම (අනුලෝමිකාය ඛත්තියාය සමන්නාගතො හොති) යනුවෙනි. මෙම දුර්වලතා මග හරවාගෙන කටයුතු කිරීම කාර්යක්ෂම ඉගෙනුමකට හේතුවෙයි. එසේම බහුශ්‍රැත භාවයට පත්වීමට නම් ශිෂ්‍යයාගේ නිපුණතාවන් කෙසේ විය යුතු ද යන්න බුදුසමයේ මෙසේ දැක්වෙයි. ඒ අතර නො ඇසූ දේ අසා ගැනීම, ඇසූ දේ අමතක නො කිරීම, පෙර ඉගෙන ගත් දෙය නැවත සිහිපත් කිරීම, නොදත් කරුණු දැන ගැනීම යන මෙවැනි ලක්ෂණයන්ගෙන් පරිපූර්ණ වූ ශිෂ්‍යයා සාර්ථක ඉගෙනුමක් කරා යන බව බෞද්ධ අදහසයි. එය විචාරාත්මක චින්තනයේ විධිමත් මාර්ගයයි. එය ඉගෙනුම්ලාභියෙකු තුළ උද්දීපනය කළ යුතු ම කුසලතාවක් බවත් ඒ තුළින් අනෙකුත් සියලුම කුසලතාවන් සංවර්ධනය කර ගැනීමට මග පාදන බවත් අනාවරණය කර ගත හැකිය.

එපමනක් නොව ඛුද්දක නිකායේ සුත්ත නිපාතයේ මංගල සූත්‍රයට අනුව "අසේවනාච බාලානං පණ්ඩිතානංච සේවනා" යන්නෙන් ද පැහැදිලි කරනු ලබන්නේ විචාරාත්මකව පුද්ගලයන් ඇසුරු කළ යුතු බවයි. සාකච්ඡා මාර්ගයෙන් ඉගැන්වීම (ම.නි. චූලගෝසිංහ සූත්‍රය), ප්‍රශ්න විසඳීමේ ක්‍රමය (අ.නි.පඤ්හ ව්‍යාකරණ සූත්‍රය) , නොයෙන් උපමා අනුසාරයෙන් ධර්මකාරණාවන් ශ්‍රාවකයන් හට පැහැදිලි කිරීම සඳහා උත්සාහගෙන ඇති අයුරු අන්ධවෙනූපමාව, (දී.නි.තේවිජ්ජ සූත්‍රය) වම්මිකෝපමාව, (ම.නි. වම්මික සූත්‍රය) අලගද්දූපම (ම.නි. අලගද්දූපම සූත්‍රය) ආදී දේශනා තුළින් ශිෂ්‍යයන්ගේ සිත් සතන් ප්‍රබෝධවත් කරමින් උපමා අනුසාරයෙන් ධර්මය දේශනා කළ බව පැහැදිලි ය.

ප්‍රයෝගික ක්‍රම මගින් ඉගැන්වීම තුළ බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරනු ලබන සෘජු ඉගැන්වීමෙන් ශ්‍රාවකයන් විසින් වහා අවබෝධ කරගනු ලබයි. තවත් පිරිසට අවශ්‍යය වන්නේ වක්‍ර ක්‍රමයෙන් ඉගැන්වීමයි. මේ පිළිබඳ මැනවින්

අවබෝධ කරගත් බුදුරජාණන් වහන්සේ රූපය නිසා මානයෙන් මත්ව සිටි රූප නන්දාවට අනුක්‍රමයෙන් මහලුවිය තෙක් ගමන් කරන අයුරු පෙන්වා යථාර්ථ පැහැදිලි කිරීම. දරු සෙනෙහසින් වෙලීසිටි කිසාගෝතමිය යහමගට ගැනීම. (ධම්මපදට්ඨ කථාව) ආදී සිද්ධීන් තුළින් සියල්ලන්ට නිවැරදි මාර්ගය පෙන්වා දුන් අයුරු පැහැදිලි ය. මේ සියලු කථාවලින් ගම්‍යමාන වන්නේ ආධ්‍යාත්මික පාරිශුද්ධත්වය ලැබීමට හෝ සමාජයේ සරලව ජීවත්වීමට ස්ත්‍රී පුරුෂ සමාජභාවය ගැටලුවක් නොවන බවයි.

ආධාරක භාවිතය තුළින් ඉගැන්වීම තම ශ්‍රාවක පිරිසට යම් කරුණක් පිළිබඳ නිවැරදි මාර්ගය පෙන්වාදීමේදී සාර්ථක ප්‍රතිඵල අත්කරගත් අයුරු බුද්ධ චරිතය තුළින් පැහැදිලි ය. දැන දැනත් අසත්‍ය ප්‍රකාශ කරනු ලබන පුද්ගලයන්ගේ ස්වභාවය කෙබඳු ද යන්න රාහුල තෙරුන් මුල් කරගෙන සිදු කළ දේශනාව. මිනිස් සිතේ ස්වභාවය පෙන්වාදීමට රෙදිකඩක් ආධාරයෙන් චුල්ල පන්ථක තෙරුන් අරබයා කළ දේශනය (ධම්මපදට්ඨ කථාව) ආදි කරුණු තුළ පෙන්වා දෙනු ලබන්නේ විචාරශීලිව ඉගෙනුම් ඉගැන්වීම් කාර්ය කළ යුතු බවයි.

බුදුරජාණන් වහන්සේ ධර්මදේශනා කිරීමේදී නිරන්තරයෙන්ම පරිසරය උපයෝගි කර ගනිමින් ධර්මය දේශනා කර ඇත. ධර්මදේශනා කිරීමේදී අවට පරිසරයේ පවතින ස්භාවය එහි වෙනස් වීම ආදිය කෙරෙහි අවධානය යොමු කරමින් සිදු කර ඇති බව පැහැදිලි ය. ශිෂ්‍යයන් වඩාත් ඇලුම් කරනු ලබන පරිසරයන් උපයෝගී කරගනිමින් ධර්මය දේශනා කළ අයුරු කොසඹෑ නුවර ඇටිටේරියා වන ආශ්‍රයෙන් කළ දේශනාවෙන් පැහැදිලි වේ. (ස.නි. සිංසපා සූත්‍රය) මෙය පරිසරය ඇසුරින් ඉගැන්වීම වේ.

බුදුරජාණන් වහන්සේ සමීපයේ වැඩසිටිමින් ධර්ම දේශනා කිරීමේ අවස්ථාව සිය ශ්‍රාවකයන්ට පමණක් නොව ශ්‍රාවිකාවන්ට ද ලබා දීම තුළින් තම ශිෂ්‍යයන්ගේ හැකියා ලැදියා තේරුම් ගන්මින් විචාරශීලීව කටයුතු කළ ආකාරය මැනවින් පෙනේ. එසේම ශාසනය තුළ තනතුරු ප්‍රදානය කිරීමේදි අසූඑක් මහා ශ්‍රාවකයන් වහන්සේලා මෙන්ම අසූඑක් මහා ශ්‍රාවිකාවන් වහන්සේලාද සිට ඇත. අග්‍ර උපස්ථායකයන් සේම අග්‍ර උපස්ථායිනාවන්ද සිට ඇත. සමස්තයක් ලෙස ගත් විට බෞද්ධ භික්ෂු භික්ෂුණී යන සමාජ දෙකම සේම උපාසක උපාසිකා යන සමාජ දෙක ද ගෞරවාදරයටපත් ව ඇත. ධර්මය පිළිබඳ මනා අවබෝධයක් තිබූ ශ්‍රාවකයන්ට මෙන්ම ශ්‍රාවිකාවින්ටද බුදුරජාණන් වහන්සේ ඉදිරියේදී ම ධර්මදේශනා කිරීමට අවස්ථාව ලබා දීම සම්මාදිට්ඨි, සච්චවිභංග ආදි සූත්‍ර දේශනා තුළින් පැහැදිලි ය. (ම.නි. සච්ඡවිභංග සූත්‍රය) මෙම ක්‍රමය සිසුන් ගුරුන් කොට ඉගැන්වීමේ ක්‍රමයයි. මේ අයුරින් ඉස්මතු කරන ලද බුදුසමයාගත දේශනා, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රම හා ශිල්ප පිළිබඳ අධ්‍යයන කිරීමෙන් අනාවරණය වුයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සම අවස්ථා අහිමි නො කර විචාරාත්මක චින්තනය බුදුසමයාගත ඉගැන්වීම් තුළ මනාව අර්ථ දැන්වෙන බවයි.

### නිගමනය

21 වැනි සියවසේ කුසලතා අතර විචාරාත්මක චින්තනය ශිෂ්‍යයා තුළ සංවර්ධනය කිරීම සඳහා වසර දෙදහස් පන්සියයකට ඉහත දී හඳුන්වා දුන් බුදු සමයාගත ඉගෙනුම් හා ඉගැන්වීම්වල විද්‍යමාන ස්ත්‍රී පුරුෂ සමාජභාවය මානව අයිතීන් උල්ලන්ගනය නො කොට සිටලූමදෙනාට පොදුවේ හිමි කර දී ඇති බව නිගමනය කළ හැකිය.

### ආශ්‍රිත ග්‍රන්ථ


බුද්දක නිකායේ ථේරීගාථාපාළි, (2005). දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය මුද්‍රණය.

ජාතකපාළි, (ප්‍රථම භාගය), බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා,(1983), පුණර්, මුද්‍රණය, (2006), කොළඹඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය මුද්‍රණය, නැදිමාල.

දීඝ නිකාය, (2005). දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය මුද්‍රණය.

මහාවග්ගපාළිය, (2005). දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය මුද්‍රණය.

සංයුත්ත නිකාය, (2005). බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, (1983) පුණර් මුද්‍රණය (2006), කොළඹඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය මුද්‍රණය, නැදිමාල.

අතුකෝරාල. ඩි. ආර්. (2016). විසි වන සියවසේ අධ්‍යාපන නව ප්‍රවනතා පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක්, දෙල්ගොඩඃ මධු ප්‍රින්ටින්, 351, නව නුවර පාර.

අධ්‍යාපන සංවාද 6, (2018). අධ්‍යයන වර්ෂය 2014/2015- කොළඹ විශ්වවිද්‍යාලය, අධ්‍යාපන පීඨය.

මහනුවරඃ ඇන්තනී බුක්බයින්ඩින් ග්‍රැෆික්, නක්දේ වීදිය.

අබේපාල, රෝලන්ඩ්, (2019). අධ්‍යාපන දර්ශනය පෙරදිග චින්තන පැතිකඩ, පන්නිපිටියඃ නෙරන්ජන් ග්‍රැපික්ස්, මහල්වරාව.

අබේපාල, රෝලන්ඩ්, (2010). අධ්‍යාපනයේ මනෝවිද්‍යාත්මක පදනම, පන්නිපිටියඃ නෙරන්ජන් ග්‍රැපික්ස්,

මහල්වරාව.

කරුණාසේන එන්. වී. කේ. (2018). ඉගෙනුම් ක්‍රමවේදය, කොට්ටාවඃ ආසිරි ප්‍රින්ටර්ස්.

නිරුක්ති සහිත සිංහල ශබ්දකෝෂය, (2003). ලියනගේ, කොළඹඃ සිරි මුද්‍රණාලය, ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

මහා සිංහල ශබ්දකෝෂය, (2008). විජේතුංග හරිස්චන්ද්‍ර, කොළඹඃ ඇම් ඩී ගුණසේන සහ සමාගම.

ශ්‍රී සුමංගල ශබ්දකෝෂයේ, (1999). සෝරත වැලිවිට, වැල්ලම්පිටියඃ චතුර මුද්‍රණාලය.

ගමගේ, අරුණ. කේ. (2014). යථාරූපී සන්නිවේදන බෞද්ධ දර්ශනය ඇසුරින් දේශනා ක 2 ලිපිය, පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය මානව ශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය. 2014.08.12 ප්‍රකාශය.

ධම්මානන්ද හිමි, මකුරුප්පේ. (2010), අතීත ශ්‍රී ලාංකීය සම්ප්‍රදායානුකූල අධ්‍යාපනයේ පැවැති ඉගෙනුම්-ඉගැන්වීම් න්‍යාය පිළිබඳ ලිපිය.

මානව සම්පත් සංවර්ධන අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යාපන ශාඛාව

ශ්‍රී ලංකා ප්‍රවීන භාෂෝපකාර සමාගමේ සත් සංවත්සර සම්බුදු ශාස්ත්‍රීය සංග්‍රහය 12 වැනි කලාපය, (2002).

21st Century Skills: Learning for Life in Our Times- Bernie Trilling & Charles Fadel(2009) -Printed in the United States of America- HB Printing 10 9 8 7 6 5 4 3 2 1.

21st Century Skills A Handbook (2020)- The Secretary, Central Board of Secondary Education, Shiksha Kendra, 2, Community Centre, Preet Vihar, Delhi – 110092.

Power and Possibility- Adult Education in a Diverse and Complex World- Fergal Finnegan and Bernie Grummell, Brill sense, Boston.

Historical efforts to implement the UNESCO 1974 Recommendation on Education in light of 3 SDGs Targets- UNESCO- 2017.